**ලංසු දැන්වීම**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහා ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය**

**ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම - 2026 - 2029**

2026 - 2029 වර්ෂ තුනක කාලයක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානයේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් 2026 – 2029 වර්ෂ සඳහා පෙරාදෙණිය ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1.මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. පුවත්පත් දැන්වීම පළ වන දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II.පිරිසිදු කිරීමේ සේවය සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික රෝහලක පසුගිය වසර පහ තුළ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ බව අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ලිපිය සමඟ සේවාව සැපයූ ආයතනයෙන් ලබා ගත් ලිපි සහ ගිවිසුම්වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III.පහත සඳහන් වගුවෙහි සඳහන් වටිනාකමට කොන්දේසි රහිත බැංකු අයිරා පහසුකම් ලබා දෙන බවට කොන්ත්‍රාත්කරු ගනුදෙනු කරන බැංකුවෙන් නිකුත් කළ ලිපිය (මුල් පිටපත)

IV.පූර්වාසන්න වර්ෂය සඳහා තම ව්‍යාපාර ලියාපදිංචි නාමය යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ යොදවනු ලැබූ සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවෙන්/ සේවක භාරකාර අරමුදලෙන් නිකුත් කළ ලිපි/ කුවිතාන්සි / ප්‍රේෂණ නිවේදන ඇතුළත් පසුගිය වසර 02 ට අදාළ ගෙවීම් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

V.පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මගින් තහවුරු කළ යුතුය.(සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. 2024/2025 වර්ෂය සඳහා පමණි )

VI.පහත වගුවේ සඳහන් පරිදි අදාළ වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල,පේරාදෙණිය නමට ලිපිනයෙහි වූ අධ්‍යක්ෂක නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ 2026.04.08 දින සිට 2026.08.05 දින දක්වා වලංගු වන සේ ලබාගත් ලංසු සුරක්ෂණයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

2. ලංසු අයදුම්පත් 2026.03.24 දින සිට 2026.04.07 දින දක්වා පේරාදෙණිය ශික්ෂණ රෝහලේ වෙබ් අඩවියෙන් (www.peradeniya-hospital.health.gov.lk) භාගත කර ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන පහත පරිදි ගාස්තුවක් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ, මහජන බැංකුවේ අංක 057100129025207 දරණ රෝහල් ගිණුම වෙත වාණිජ බැංකුවක් මගින් තැන්පත් කල යුතු අතර, අදාළ **රෝහලේ ප්‍රසම්පාදන අංකය Reference** හි ඇතුළත් කල යුතුය. මුදල් තැන්පත්

කිරීමට අදාළ ලදුපතෙහි ගණුදෙනුකරුගේ රිසිට්පත (Customer Copy) ලංසුව සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

| අනු අංකය | ආයතනයේ නම | ප්‍රසම්පාදන අංකය | බැංකු අයිරා පහසුකම් ලබා ගත යුතු අවම වටිනාකම | ලංසු ඇපකරය (රු.) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 01 | ගලහා ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය | THP/EL/01/2026 | 1,650,000.00 | 325,000.00 | 3,500.00 |

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2026.04.08 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ **"සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගිණුම් අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ගෙනවිත් භාරදීමට කටයුතු කළ යුතුය. ලංසු ලියවිලි බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2026-2029 වර්ෂයේ පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහා ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථානය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. 2026.04.08 දින පෙ.ව. 10.00 දක්වා ලංසු භාරගැනීම පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ගිණුම් අංශයේ දී සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා පේරාදෙණිය ශික්ෂණ රෝහලේ පාලන අංශය අමතන්න. (දුරකථන අංක 0812388001/ 0181238802 )

6. පූර්ව ලංසු රැස්වීම 2026.03.27 දින පෙ.ව 11.00 පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සාකච්ඡා කාමරයෙහි දී පැවැත්වේ

7. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,<br>
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව ,<br>
ශික්ෂණ රෝහල,<br>
පේරාදෙණිය.